# ජාතික රාජ්‍ය සභාවේ

# 1978 අංක 40 දරන මෙට්‍රික් ඒකක (ආනුෂංගික විධිවිධාන) පනත

[සහතිකය සටහන් කළේ 1978 අගෝස්තු මස 16 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී

(1978 අගෝස්තු මස 18 වැනි දින ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී)

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

---

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැක

මිල: ශත 60 යි　　　　තැපැල් ගාස්තුව: ශත 15 යි

# ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 40 දරන මෙට්‍රික් ඒකක (ආනුෂංගික විධිවිධාන) පනත

[සහතිකය සටහන් කළේ 1978 අගෝස්තු මස 16 වන දින]

එල්. ඩී.—ඕ. 15/76.

**මෙට්‍රික් මිනුම් ඒකක ආරම්භ කිරීමේ ප්‍රතිඵලයක් වශයෙන් ඇතැම් ප්‍රඥප්ති සංශෝධනය කිරීම පිණිස ද ඊට සම්බන්ධ හෝ ආනුෂංගික කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ පනතකි.**

ශ්‍රී ලංකා ජනරජයේ ජාතික රාජ්‍ය සභාව විසින් මෙසේ පනවනු ලැබේ :—

**1.** මෙ පනත ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 40 දරන මෙට්‍රික් ඒකක (ආනුෂංගික විධිවිධාන) පනත යනුවෙන් හඳුන්වනු ලබන අතර ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නියමයකින් අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන (මෙහි මින් මතු "නියමිත දිනය" යනුවෙන් සඳහන් කරනු ලබන) දිනයක එය ක්‍රියාත්මක වන්නේ ය. — කෙටි නාමය.

**2.** මෙ පනතේ උපලේඛනයේ I වන තීරයෙහි දක්වෙන ප්‍රඥප්ති එම උපලේඛනයේ II වන තීරයේ අනුරූප සටහනෙහි දක්වෙන සංශෝධනවලට යටත්ව බලපවත්වන්නේ ය. — ඇතැම් ප්‍රඥප්ති සංශෝධනය කිරීම.

**3.** මෙට්‍රික් මිනුම් ඒකක නොවන මිනුම් ඒකක කිසිවකට යොමු කිරීමෙන් යම් ක්‍රියාවක් හෝ දෙයක් කරනු ලැබිය යුතු යයි හෝ ඉටු කරනු ලැබිය යුතු යයි නියම කරනු ලබන්නේ යම් මාර්ගයකින් ද ඒ මාර්ගයෙන්— — ගිවිසුම් හෝ සංශෝධනය කරනු ලබන ප්‍රඥප්ති යටතේ වූ නියම හෝ වලංගුව බලපැවැත්විය යුතු බව.

(අ) නියමිත දිනයට ඉහතින් ම වූ දිනයෙහි පවත්නා යම් ගිවිසුමක්, හෝ

(ආ) මෙහි උපලේඛනයේ I වන තීරයෙහි දක්වෙන්නා වූ ද ඒ දිනයෙහි බලපවත්නා වූ ද ප්‍රඥප්ති අතුරින් යම් ප්‍රඥප්තියක් යටතේ සාදනු ලැබූ යම් නියමයක්

මෙ පනතෙහි වූ කිසිවකින් අවලංගු වෙතැයි සලකනු නොලැබිය යුතු ය.

## උපලේඛනය

| I වන තීරය<br>ප්‍රඥප්තිය | II වන තීරය<br>සංශෝධන |
|---|---|
| 1. වෛද්‍ය අවශ්‍යතා ආඥාපනත. ... | 2 වන වගන්තියෙහි "වත්ත" යන්නෙහි අර්ථකථනය වෙනුවට පහත සඳහන් අර්ථකථනය ආදේශ කරන්න :—<br><br>' "වත්ත" යන්නෙන් කම්කරුවන් සේවයෙහි නියුක්ත කරනු ලැබ ඇත්තා වූ ද, තේ, රබර්, කෝපි, කොකෝවා ඇට, කරදමුංගු, කොකෝවා, කපුරු, ගම්මිරිස් හෝ සින්කෝනා සැබැවින්ම වගා කර ඇත්තා වූ ද හෙක්ටෙයාර් හතරක ප්‍රමාණයෙන් යුත් යම් වත්තක් අදහස් වේ. '. |

| I වන තීරය<br>ප්‍රඥප්තිය | II වන තීරය<br>සංශෝධන | |
|---|---|---|
| 2. රේගු ආඥාපනත. | ... 1. 17 වන වගන්තිය වෙනුවට පහත සඳහන් වගන්තිය ආදේශ කරන්න :— | |
| | " ශ්‍රී ලංකාව සඳහා වූ මිනුම ඒකක අනුව ශ්‍රී ලංකාවෙ මුදලින් තීරු බදු ගෙවිය යුතු බව. | 17. සියලුම තීරු බදු මෙන් ම ආඥාපනත යටතේ වූ සියලු දණ්ඩන මෙහි ලා දක්වා ඇති විවිධ වර්ගවල මුදලින් හා නිශ්චිත විනිමය අනුපාතික අනුව, බ්‍රිතාන්‍ය රත්‍රන් හෝ රිදී මුදලින් ගෑ ශ වෙනත් යම මුදල් වර්ගයකින් හා අමාත්‍යවරයා විසින් කලින් කල නිශ්චය කරනු ලබන විනිමය අනුපාතිකයක් අනුව ද ශ්‍රී ලංකාව සඳහා වූ මිනුම් ඒකක අනුව ද ගෙවීම හා බාර ගැනිම කළ යුතු ය ; තව ද යම නිශ්චිත ප්‍රමාණයක් අනුව හෝ යම නිශ්චිත වටිනාකමක් අනුව හෝ ඒ තීරු බදු නියම කරනු ලැබ ඒ සඳහා ඉඩ දෙනු ලැබූ සියලු අවස්ථාවන්හි දී එම තීරු බද්ද එම අනුපාතය අනුව යම වැඩි හෝ අඩු ප්‍රමාණයකට ෆ වටිනාකමට අදාළ වන්නේ යයි සලකනු ලැබිය යුතු ය ; තව ද |
| | තීරු බදුවල එකතුව භාණ්ඩාගාරය යනාදියට ගෙවිය යුතු බව. | සියලු තීරු බදුවල එකතුව අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලබන ආකාරයකට හා කාලවල දී අයකැමි විසින් භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම්ට හෝ ශ්‍රී ලංකාවේ උපගණකාධිකාරිවරයන්ට හෝ ගෙවිය යුතු ය. ". |
| | 2. " අ " උපලේඛනයෙහි, " අපනයන තීරුබදු " යන ශීර්ෂ පාඨය යටතේ — | |

(අ) පහත සඳහන් කරුණු, එනම් :—

| භාණ්ඩය | රු. ශ. | ඒකකය | තීරු බද්ද |
|---|---|---|---|
| "(කැබලි ක්‍රේප් රබර් හැර) රබර් : | | | |
| ආර්.එම්.ඒ. අංක 1 දරන මිට රබර් රාත්තලක තක්සේරු කළ නැව තෙක් වියදම් සහිත වටිනාකම | 1.60 ට වැඩි නොවන විට | අඩංගු වියලි රබර් ප්‍රමාණයෙන් රාත්තලය අපනයන තීරු බද්ද ශත 15ක් වන්නේ ය. | — |
| එම | 1.60 ට වැඩි එහෙත් 2.10 ට වැඩි නොවන විට | එම | ශත 15 සහ රු. 1.60 ට අධික අතිරික්තයෙන් 40%ක් |
| එම | 2.10 ට වැඩි, එහෙත් 2.60 ට වැඩි නොවන විට | එම | ශත 35 සහ රු. 2.10 ට අධික අතිරික්තයෙන් 50%ක් |
| එම | 2.60 ට වැඩි, එහෙත් 3.10 ට වැඩි නොවන විට | එම | ශත 60 සහ රු. 2.60 ට අධික අතිරික්තයෙන් 60%ක් |
| එම | 3.10 ට වැඩි වන විට | එම | ශත 90 සහ රු. 3.10 ට අධික අතිරික්තයෙන් 70%ක් |
| රබර් (කැබලි ක්‍රේප්) : | | | |
| ආර්.එම්.ඒ. අංක 1 කැබලි ක්‍රේප් රාත්තලක තක්සේරු කළ නැව තෙක් වියදම් සහිත වටිනාකම | 1.60 ට වැඩි නොවන විට | අඩංගු වියලි රබර් ප්‍රමාණයෙන් රාත්තලක අපනයන තීරු බද්ද ශත 15ක් වන්නේය. | — |
| එම | 1.60 ට වැඩි, එහෙත් 2.10 ට වැඩි නොවන විට | එම | ශත 15 සහ රු. 1.60 ට අධික අතිරික්තයෙන් 40%ක් |
| එම | 2.10 ට වැඩි, එහෙත් 2.60 ට වැඩි නොවන විට | එම | ශත 35 සහ රු. 2.10 ට අධික අතිරික්තයෙන් 50%ක් |
| එම | 2.60 ට වැඩි, එහෙත් 3.10 ට වැඩි නොවන විට | එම | ශත 60 සහ රු. 2.60 ට අධික අතිරික්තයෙන් 60%ක් |
| එම | 3.10 ට වැඩි වන විට | එම | ශත 90 සහ රු. 3.10 ට අධික අතිරික්තයෙන් 70%ක්" |

වෙනුවට, පහත සඳහන් කරුණු ආදේශ කරන්න :—

| භාණ්ඩය | ඒකකය | බිරු බද්ද |
|---|---|---|
| | | රු. ශ. |
| " කැබලි ක්‍රේප් හැර වෙනත් සෑම වර්ග යකම ක්‍රේප් රබර් | කිලෝ ග්‍රෑම 100 කට | ... 6 65 |
| සෑම වර්ගයකම ෂීට් රබර් | ... කිලෝ ග්‍රෑම 100 කට | ... 6 65 |
| රබර් කිරි | ... කිලෝ ග්‍රෑම 100 කට | ... 6 65";තව ද |

(ආ) පහත සඳහන් කරුණු, එනම් :—

| භාණ්ඩය | ඒකකය | බිරු බද්ද |
|---|---|---|
| | | රු. ශ. |
| " තේ | ... රාත්තලකට | ... 0 65 " |

වෙනුවට පහත සඳහන් කරුණු ආදේශ කරන්න :—

| භාණ්ඩය | ඒකකය | බිරු බද්ද |
|---|---|---|
| | | රු. ශ. |
| " කළු තේ | ... කිලෝ ග්‍රෑම 100 කට | ... 86 0 |
| අමු තේ දළු | ... කිලෝ ග්‍රෑම 100 කට | ... 86 0 |
| පැකට් කළ තේ | ... කිලෝ ග්‍රෑම 100 කට | ... 53 0" |

3. "ඇ" උපලේඛනයේ 1 වන කොටසෙහි "අපනයන වරාය ගාස්තු" යන ශීර්ෂ පාඨය යටතේ—

(I) පහත සඳහන් කරුණ, එනම් :—

| විස්තරය | ප්‍රමාණය |
|---|---|
| | රු. ශ. |
| " පෙට්ටිවල අසුරන ලද තේ සම්බන්ධ යෙන් වූ විට, තේවල ශුද්ධ බරෙන් සෑම රාත්තල් 100 කට හෝ ඉන් කොටසකට | 00 8½ " |

වෙනුවට පහත සඳහන් කරුණ ආදේශ කරන්න :—

| විස්තරය | ප්‍රමාණය |
|---|---|
| | රු. ශ. |
| " පෙට්ටිවල හෝ චෙස්ට් පෙට්ටිවල අසුරන ලද තේ සම්බන්ධයෙන් වූ විට, තේවල ශුද්ධ බරෙන් සෑම කිලෝ ග්‍රෑම 100 කට හෝ ඉන් කොටසකට | 0 30 " ; තව ද |

(II) පහත සඳහන් කරුණ, එනම් :—

| විස්තරය | ප්‍රමාණය |
|---|---|
| | රු. ශ. |
| " රබර් හෝ කපාපු පොල් අඩංගු මිටි, පෙට්ටි හෝ චෙස්ට් පෙට්ටි සඳහා— | |
| (අ) එකක ශුද්ධ බර රාත්තල් 200 නො ඉක්මවන විට | 00 7½ |
| (ආ) ශුද්ධ බර රාත්තල් 200 ඉක්මවන විට, සෑම අතිරේක රාත්තල් 20 ක් හෝ එහි ඉතිරි වන සෑම කොටසක් සඳහා ඉහත (අ) ඡේදයෙහි දක් වෙන ප්‍රමාණය වැඩිවිය යුතු මුදල | 00 1 ", |

වෙනුවට, පහත සඳහන් කරුණ ආදේශ කරන්න:—

| විස්තරය | ප්‍රමාණය<br>රු. ශත |
| --- | --- |
| " රබර් හෝ කපාපු පොල් අඩංගු මිටි, පෙට්ටි හෝ වෙස්ට පෙට්ටි සඳහා— | |
| (අ) එකක ශුද්ධ බර කිලෝ ග්‍රෑම් 100 නොඉක්මවන විට | 0 12 |
| (ආ) ශුද්ධ බර කිලෝ ග්‍රෑම් 100 ඉක්මවන විට, සෑම අතිරේක කිලෝ ග්‍රෑම් 10 ක් හෝ එහි ඉතිරි වන සෑම කොටසක් සඳහා ඉහත (අ) ඡේදයෙහි දක්වෙන ප්‍රමාණයට වැඩිවිය යුතු මුදල | — 00 1½ ". |

| I වන තීරය<br>ප්‍රඥප්තිය | II වන තීරය<br>සංශෝධන |
| --- | --- |
| 3. රබර් පාලන පනත | 1. 16 වන වගන්තිය වෙනුවට, පහත සඳහන් වගන්තිය ආදේශ කරන්න :— |

" බලපත්‍රලත් ස්ථානයෙහි තරාදි තබා ගත යුතු බව.

16. බලපත්‍රලත් සෑම ගෙවලෙන්දකු විසින් ම ස්වකීය බලපත්‍ර ලත් ස්ථානයෙහි කිලෝග්‍රෑම් පණහක් දක්වා කිරිය හැකි තරාදියක් තබා ගත යුතු අතර පාලක විසින් හෝ පාලක විසින් බලය දෙනු ලැබූ නිලධරයකු විසින් හෝ ඒ ස්ථානයෙහි ඇති යම් රබර් ප්‍රමාණයක් කිරන ලෙස ඉල්ලා සිටිනු ලැබූ විට එසේ කිරනු ලැබීමට සැලැස්විය යුතුය; තව ද එම ස්ථානයෙහි ඇති රබර් තොගයේ බර 15 වන වගන්තිය යටතේ පවත්වා ගෙන යනු ලබන සටහනෙහි දක්වෙන බර ප්‍රමාණයන් සමග සංසන්දනය කිරීමට පාලකට හෝ ඒ බලය දෙනු ලැබූ නිලධරයාට හෝ අවසර දීම හෝ සියලු පහසුකම් සැලසීම හා සහාය දීම හෝ ඔහු විසින් කළ යුතු ය.".

2. 25 වන වගන්තියේ (1) වන උපවගන්තිය වෙනුවට පහත සඳහන් උපවගන්තිය ඒ වගන්තියෙහි ආදේශ කරන්න :—

"(1) ශ්‍රී ලංකාවෙන් අපනයනය කරනු ලබන සෑම රබර් කිලෝග්‍රෑම් සියයක් සඳහා ශත පණහ බැගින් ආගණනය කරනු ලැබූ අපනයන තීරු බද්දක් ඒ රබර් සම්බන්ධයෙන් අයකිරීම, ලබාගැනීම හා ගෙවීම කළ යුතු ය :

එසේ වුව ද නැවත අපනයනය කිරීමේ කාර්ය සඳහා ශ්‍රී ලංකාවට ආනයනය කරනු ලැබ ඇති බවට ප්‍රධාන රේගු අයකැමි සෑහීමට පත් වන පරිදි ඔප්පු කරනු ලැබූ කිසිදු රබර් ප්‍රමාණයක් සඳහා එවැනි තීරු බද්දක් අය කිරීම හෝ ලබාගැනීම හෝ නොකළ යුතු ය.".

3. 52 වන වගන්තියේ (1) වන උපවගන්තියෙහි "වත්ත" යන්නෙහි සහ "කුඩා ඉඩම" යන්නෙහි අර්ථකථන වෙනුවට පහත සඳහන් අර්ථකථන ඒ වගන්තියෙහි පිළිවෙළින් ආදේශ කරන්න :—

"වත්ත" යන්නෙන් ප්‍රමාණයෙන් හෙක්ටෙයාර් හතරකට වඩා නොඅඩු වූ ද රබර් කිරි රැස්කර ගැනීමේ කාර්යය සඳහා රබර් පැල වගා කර ඇත්තා වූ ද බිම් ප්‍රදේශයක් අදහස් වේ ;

"කුඩා ඉඩම" යන්නෙන් ප්‍රමාණයෙන් හෙක්ටෙයාර් හතරකට වඩා අඩු වූ ද රබර් කිරි රැස්කර ගැනීමේ කාර්යය සඳහා රබර් පැල වගා කර ඇත්තා වූ ද බිම් ප්‍රදේශයක් අදහස් වේ.".

(ආනුෂංගික විධිවිධාන) පනත

| I වන තීරය | II වන තීරය |
|---|---|
| ප්‍රඥප්තිය | සංශෝධන |
| 4. රබර් නැවත වගා කිරීමේ සහනාධාර පනත. | 7 වන වගන්තියේ (1) වන, (2) වන හා (3) වන උපවගන්ති වෙනුවට පහත සඳහන් උපවගන්ති ඒ වගන්තියෙහි පිළිවෙළින් ආදේශ කරන්න :—<br><br>"(1) ශ්‍රී ලංකාවෙන් අපනයනය කරනු ලබන සෑම ෂීට් රබර් කිලෝග්‍රෑමයක් සඳහා ශත දහඅටක අපනයන තීරු බද්දක් අයකිරීම, ලබාගැනීම හා ගෙවීම කළ යුතු ය.<br><br>(2) ශ්‍රී ලංකාවෙන් අපනයනය කරනු ලබන සෑම කැබලි ක්‍රේප් රබර් කිලෝග්‍රෑමයක් සඳහා ශත දහඅටක අපනයන තීරු බද්දක් අයකිරීම, ලබාගැනීම හා ගෙවීම කළ යුතු ය.<br><br>(3) ශ්‍රී ලංකාවෙන් අපනයනය කරනු ලබන (කැබලි ක්‍රේප් රබර් නොවන) සෑම ක්‍රේප් රබර් කිලෝග්‍රෑමයක් සඳහා ශත දහඅටක අපනයන තීරු බද්දක් අයකිරීම, ලබාගැනීම හා ගෙවීම කළ යුතු ය.". |
| 5. රබර් පර්යේෂණ ආඥාපනත. | 6 වන වගන්තියේ (4) වන උපවගන්තිය වෙනුවට පහත සඳහන් උපවගන්තිය ඒ වගන්තියෙහි ආදේශ කරන්න :—<br><br>" (4) (1) වන උපවගන්තිය යටතේ වූ තීරු බද්ද ආගණනය කිරීමේ කාර්යය සඳහා, ද්‍රව රබර් කිරි එක් ලීටරයක් වියලි රබර් ග්‍රෑම් තුන්සිය පනහකට සමාන ලෙස සලකනු ලැබිය යුතු අතර කැටිගැසුණු රබර් කිරි කිලෝග්‍රෑම් එකහමාරක් වියලි රබර් කිලෝග්‍රෑම් 1 කට සමාන ලෙස සලකනු ලැබිය යුතු ය.". |
| 6. 1957 අංක 51 දරන තේ පාලන පනත. | 1. 18 වන වගන්තියේ (4) වන උපවගන්තිය වෙනුවට පහත සඳහන් උපවගන්තිය ඒ වගන්තියෙහි ආදේශ කරන්න :—<br><br>"(4) බලපත්‍ර ලත් සෑම වෙළෙන්දකු විසින් ම ස්වකීය බලපත්‍ර ලත් ස්ථානයෙහි ද මේ වගන්තියේ (3) වන උපවගන්තිය අදාළ වන සෑම නිෂ්පාදකයකු විසින් ම ස්වකීය තේ කර්මාන්ත ශාලාවෙහි ද කිලෝග්‍රෑම් පණගක් දක්වා කිරිය හැකි තරාදි තබා ගත යුතු ය :<br><br>එසේ වුව ද ලියාපදිංචි කළ අපුරන්නකු විසින් අපුරනු ලැබූ සෑදූ තේ පමණක් වෙළදාම් කරන බලපත්‍ර ලත් වෙළෙන්දකු විසින් මේ උපවගන්තියෙහි සඳහන් තරාදි ස්වකීය බලපත්‍ර ලත් ස්ථානයෙහි තබා ගැනීම අවශ්‍ය නොවන්නේ ය.".<br><br>2. 63 වන වගන්තියේ (1) වන උපවගන්තියෙහි "වත්ත" යන්නෙහි සහ "කුඩා ඉඩම" යන්නෙහි අර්ථකථන වෙනුවට පහත සඳහන් අර්ථකථන ඒ වගන්තියෙහි පිළිවෙළින් ආදේශ කරන්න :—<br><br>"වත්ත" යන්නෙන් ප්‍රමාණයෙන් හෙක්ටෙයාර් හතරක් හෝ ඊට වැඩි වූ ද සෑදූ තේවලට පරිවර්තනය කරනු පිණිස එහි දළු නෙලා ගැනීමේ කාර්යය සඳහා තේ පැළෑටි වගා කර ඇත්තා වූ ද බිම් ප්‍රදේශයක් අදහස් වේ ;<br><br>"කුඩා ඉඩම" යන්නෙන් ප්‍රමාණයෙන් හෙක්ටෙයාර් හතරකට වඩා අඩු වූ ද සෑදූ තේවලට පරිවර්තනය කරනු පිණිස එහි තේ දළු නෙලා ගැනීමේ කාර්යය සඳහා තේ පැළෑටි වගා කර ඇත්තා වූ ද බිම් ප්‍රදේශයක් අදහස් වේ.". |

(ආනුෂංගික විධිවිධාන) පනත

| I වන තීරය<br>ප්‍රඥප්තිය | II වන තීරය<br>සංශෝධන |
|---|---|
| 7. 1958 අංක 2 දරන තේ හා රබර් වතු (කැබලි කිරීම පාලනය කිරීමේ) පනත. | 1. 8 වන වගන්තියේ (1) වන උපවගන්තිය වෙනුවට පහත සඳහන් උපවගන්තිය ඒ වගන්තියෙහි ආදේශ කරන්න :— |

"(1) පහත සඳහන් අවස්ථාවල දී එනම් :—

(අ) තේ හෝ රබර් වත්තක් කැබලි ගණනකට බෙදීමක් ඇතුළත් නො වන ඒ තේ හෝ රබර් වත්තේ අයිතිය පැවරීමට ;

(ආ) (i) යම් තේ හෝ රබර් වත්තක් කැබලිවලට බෙදිය යුතුව ඇත්නම් හෝ බෙද වෙන් කළ යුතුව ඇත්නම් ඒ සියලු කැබලි, නැතහොත් ඒ සියලු කැබලි ඉන් ප්‍රමාණයෙන් හෙක්ටෙයාර් හතලිහකට නො අඩු එක් කැබෙල්ලක් හැර නිවාස තැනීමේ අරමුණක් ලෙස ජාතික නිවාස පනතේ 2 වන වගන්තියෙන් ප්‍රකාශ කරනු ලැබූ අරමුණක් සඳහා, හෝ යම් කාර්මික කටයුත්තක් සඳහා, හෝ නගරයක් සං වර්ධනය කිරීම සඳහා, හෝ වෙන යම් නියමිත කාර්යයක් සඳහා පාවිච්චි කළ යුතුව ඇත් නම්, හෝ යාබද තේ හෝ රබර් වත්තක් සමග සම්බන්ධ කළ යුතුව ඇත් නම්, සහ ඒ සම්බන්ධ කිරීමෙන් එසේ සම්බන්ධ කරනු ලැබූ ඉඩම්වල වඩා කාර්යක්ෂම වූත් සකසුරුවම් සහිතවූත් කළමනාකරණයක් ඇති වේ යයි මණ්ඩලය අදහස් කරන්නේ නම් ;

(ii) යම් තේ හෝ රබර් වත්තක කෘෂි කාර්මික තත්වය දැනටමත් කොපමණ අසතුටුදායක දැයි කියත හොත්, ඒ තේ හෝ රබර් වත්ත බෙදීම හෝ කැබලිවලට බෙද වෙන් කිරීම හෝ මණ්ඩලයේ මතය අනුව ඒ තත්ත්වය කෙරෙහි හානිකර අන්දමින් බලපෑමට ඉඩ නොමැති නම් ; හෝ

(iii) යම් තේ හෝ රබර් වත්තක් බෙදිය යුතුව ඇත්තේ හෝ බෙද වෙන් කළ යුතුව ඇත්තේ යම් කැබලි ප්‍රමාණයකට ද ඒ එක් එක් කැබැල්ල, තේ වත්තක් සම්බන්ධයෙන් වූ විට ප්‍රමාණයෙන් හෙක්ටෙයාර් දෙසියය කට නොඅඩු නම් සහ රබර් වත්තක් සම්බන්ධයෙන් වූ විට හෙක්ටෙයාර් සියයකට නොඅඩු නම්, සහ ඒ තේ හෝ රබර් වත්ත බෙදීම හෝ කැබලි වලට බෙද වෙන් කිරීම, මණ්ඩලයේ මතය අනුව, දේපළේහි කෘෂිකාර්මික තත්වය හෝ එහි කාර්යක්ෂම

| I වන තීරය<br>ප්‍රඥප්තිය | II වන තීරය<br>සංශෝධන |
|---|---|
| | ලංකාවේ ව්‍යවහාර මුදල් ප්‍රකාර ප්‍රකාශ කිරීමේ කාර්යය සඳහා විනිමය අනුපාතිකය රේගු ආඥා පනතේ 17 වන වගන්තිය යටතේ දක්වා ඇත්තා වූ ද එම දිනයෙහි බලපවත්නා වූ ද විනිමය අනුපාතිකය ම වන්නේ ය.<br><br>(3) විදේශ තේ වෙන්දේසියක දී විකිණීම සඳහා ශ්‍රී ලංකාවෙන් අපනයනය කරන ලද තේ කිලෝග්‍රෑමයක් එවැනි වෙන්දේසියක දී විකුණනු ලබන්නේ යම් මිලකට ද ඒ මිලෙන් (1) වන උපවගන්තියේ කාර්ය සඳහා පහත සඳහන් අඩු කිරීම් කළ යුතු ය:–<br><br>(අ) එම තේ කිලෝග්‍රෑමය වෙනුවෙන් ශ්‍රී ලංකාවේ දී ගෙවන ලද අපනයන තීරු බද්ද සහ යම් සෙස් බද්දක්, සහ<br><br>(ආ) එබඳු විදේශ තේ වෙන්දේසියක දී විකිණීම සඳහා ශ්‍රී ලංකාවෙන් අපනයනය කරන ලද තේ කිලෝග්‍රෑමයක් සම්බන්ධයෙන් නැව් ගාස්තු, රක්ෂණය සහ පැටවීම, ගොඩබෑම ආදී වියදම් පියවීමට ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමයකින් අමාත්‍යවරයා විසින් නියම කරනු ලැබූ මුදල.<br><br>(4) (3) වන උපවගන්තියේ (ආ) ඡේදය යටතේ ස්වකීය බලතල ක්‍රියාත්මක කිරීමේ දී විවිධ විදේශ තේ වෙන්දේසි වෙනුවෙන් විවිධ මුදල් ප්‍රමාණයන් අමාත්‍යවරයා විසින් නියම කරනු ලැබිය හැකිය ;<br><br>එසේ වුව ද (3) වන උපවගන්තිය යටතේ ක්‍රියා කිරීමේ දී අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන යම් මුදල් ප්‍රමාණයක් හෝ මුදල් ප්‍රමාණයන් ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබිය යුතු අතර, ඉක්බිතිව හැකි පහසු ඉක්මණින් එය ජාතික රාජ්‍ය සභාව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය. තව ද ජාතික රාජ්‍ය සභාව විසින් මාස දෙකක් ඇතුළත දී යෝජනා සම්මතයක් මඟින් ඊට විරුද්ධව යෝජනාවක් සම්මත කරනු ලැබුවහොත් මිස, ඒ මුදල් ප්‍රමාණය හෝ මුදල් ප්‍රමාණයන් දිගට ම අයකරගෙන යා යුතු ය. එසේම තවදුරටත් අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන මුදල් ප්‍රමාණය හෝ මුදල් ප්‍රමාණයන්, ඒ කාලය ඉකුත්වීම හෝ ඔහුගේ නියමය යෝජනා සම්මතයක් මඟින් ජාතික රාජ්‍ය සභාව විසින් ප්‍රත්‍යාදිෂ්ට කිරීම යන අවස්ථා දෙකින් කලින් එළඹෙන කවර හෝ අවස්ථාව තෙක්, නීත්‍යනුකූල බද්දක් ලෙස අමාත්‍යවරයා විසින් අයකර ගනු ලැබීම මේ උපවගන්තියෙහි වූ කිසිවකින් වළක්වනු ලැබෙතැයි සලකනු නොලැබිය යුතු ය.''. |

| I වන තීරය | II වන තීරය |
| --- | --- |
| ප්‍රඥප්තිය | සංශෝධන |

2. 5 වන වගන්තියේ (1) වන සහ (2) වන උපවගන්ති වෙනුවට පහත සඳහන් උපවගන්ති ඒ වගන්තියෙහි පිළිවෙළින් ආදේශ කරන්න :—

" (1) මේ වගන්තියෙහි මින් මතු " තක්සේරු කළ මිල " යනුවෙන් සඳහන් කරනු ලබන්නා වූ ද—

(අ) ඉංග්ලිෂ් ඇන්ඩ් ස්කොට්ෂ් ජොයින්ට් කෝපරේටිව් හෝල් සේල් සොසයිටි ලිමිටඩ් නමැති සමාගම විසින් ශ්‍රී ලංකාවේ දී නිෂ්පාදනය කරන ලද යම් තේ, හෝ

(ආ) මේ උපවගන්තියේ (අ) ඡේදයෙහි හෝ 2 වන වගන්තියේ (1) වන උපවගන්තියෙහි හෝ සඳහන් තේ නොවන්නා වූ සහ මේ පනත යටතේ නිකුත් කරන ලද බලපත්‍රයක් මගින් ශ්‍රී ලංකාවෙන් අපනයනය කිරීමට බලය දෙනු ලැබ ඇත්තා වූ යම් තේ

කිලෝග්‍රෑමයක් යම් දිනයක කොළඹ තේ වෙන්දේසියක දී විකුණනු ලැබුවේ නම් ඒ දිනයෙහි උපයා ගැනීමට සාධාරණව අපේක්ෂා කරනු ලබන්නා වූ ද මිල, කොළඹ තේ වෙන්දේසියක දී තේ විකුණනු ලබන පවත්නා මිල පදනම් කරගෙන කොමසාරිස්වරයා විසින් (2) වන උපවගන්තියේ කාර්ය සඳහා නිශ්චය කළ යුතු ය.

(2) (1) වන උපවගන්තිය අදාළ වන්නා වූ යම් තේ ප්‍රමාණයක් ශ්‍රී ලංකාවෙන් අපනයනය කිරීමට අවසර දෙමින් මේ පනත යටතේ වූ බලපත්‍රය නිකුත් කිරීමට පෙර—

(අ) බලපත්‍රය නිකුත් කරනු ලැබුවේ යම් දිනයක ද ඒ දිනයෙහි එම තේ කිලෝග්‍රෑමයක තක්සේරු කළ මිල රුපියල් හතරයි ශත හතළිහකට වැඩි නොවන මුදලකින් රුපියල් හයයි ශත පනස්පහකට අධික වන අවස්ථාවක, එම අධිකයෙන් දෙකෙන් එක් පංගුවකට සමාන විය යුතු වූ , සහ

(ආ) එම තක්සේරු කළ මිළ රුපියල් හතරයි ශත හතළිහකට වැඩි වන මුදලකින් රුපියල් හයයි ශත පනස්පහකට අධික වන අවස්ථාවක, රුපියල් දෙකයි ශත විස්සක් විය යුතු වූ

බද්දක් එම තේවල එක් එක් කිලෝග්‍රෑමය වෙනුවෙන් අය කිරීම, ලබා ගැනීම හා ගෙවීම කළ යුතු ය.".

3. 7 වන වගන්තියේ (1) වන උපවගන්තිය වෙනුවට පහත සඳහන් උපවගන්තිය ආදේශ කරන්න :—

" (1) කොමසාරිස්වරයා විසින් නිකුත් කරන ලද අවසර පත්‍රයක අධිකාරය යටතේ හැර කිසිම තැනැත්තකු විසින් තේ අපනයනය නොකළ යුතු ය :

එසේ වුව ද—

(අ) ත්‍යාගයක් වශයෙන් පාර්සල් තැපැලෙන් යවනු ලබන හෝ මගියකුගේ පෞද්ගලික ගමන් බඩුවල කොටසක් වශයෙන් යම් යාත්‍රාවක හෝ ගුවන් යානාවක ගෙන යනු ලබන කිලෝග්‍රෑම් හයකට වැඩි නොවන්නා වූ යම් තේ ප්‍රමාණයක්, හෝ

| I වන තීරය<br>ප්‍රඥප්තිය | II වන තීරය<br>සංශෝධන |
|---|---|
| | (ආ) වාණිජ සැම්පල් වශයෙන් යවනු ලබන යම් තේ ප්‍රමාණයක්,<br><br>අපනයනය කිරීම සඳහා කිසිම බලපත්‍රයක් අවශ්‍ය නොවන්නේ ය.''.<br><br>4. 12 වන වගන්තියේ (1) වන සහ (2) වන උපවගන්ති වෙනුවට පහත සඳහන් උපවගන්ති ඒ වගන්තියෙහි පිළිවෙළින් ආදේශ කරන්න :—<br><br>'' (1) යම් තේ ප්‍රමාණයක් කොළඹ තේ වෙන්දේසියක දී විකුණනු ලබන අවස්ථාවක, එම විකිණීම කරනු ලබන අවස්ථාවේ දී තේවල අයිතිකරු වන තැනැත්තා විසින්, විකිණීමේ දිනයෙන් පසු වැඩ කරන දින තුනක් පසු නොවී එම තේවල විස්තරය, ප්‍රමාණය සහ එක කිලෝග්‍රෑමයක විකුණුම් මිල ද ගැනුම්කරුගේ නම සහ ලිපිනය ද කොමසාරිස්වරයා වෙත ලියවිල්ලකින් ප්‍රකාශ කළ යුතු ය.<br><br>(2) විදේශීය තේ වෙන්දේසියක දී විකිණීම සඳහා ශ්‍රී ලංකාවෙන් අපනයනය කරනු ලැබූ යම් තේ ප්‍රමාණයක් එවැනි වෙන්දේසියක දී විකුණනු ලබන අවස්ථාවක එම විකිණීම කරනු ලබන අවස්ථාවේ දී තේවල අයිතිකරු වන තැනැත්තා විසින් විකිණීමේ දිනයෙන් පසු දින දහතරක් පසු නොවී එම තේවල විස්තරය, ප්‍රමාණය, සහ එක කිලෝග්‍රෑමයක විකුණුම් මිල ද ගැනුම්කරුගේ නම සහ ලිපිනය ද කොමසාරිස්වරයා වෙත ලියවිල්ලකින් ප්‍රකාශ කළ යුතු ය.''. |
| 9. ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 14 දරන ශ්‍රී ලංකා තේ මණ්ඩල පනත. | 1. 13 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (අ) ඡේදයෙහි '' සෑම තේ රාත්තල් සියයක් සඳහා රුපියල් දහයයි ශත හැට පහක් '' යන වචන වෙනුවට '' සෑම කිලෝග්‍රෑම් සියයක් සඳහා රුපියල් විසිපහයි ශත හැත්තෑවක් '' යන වචන ආදේශ කරන්න.<br><br>2. 31 වන වගන්තියෙහි—<br><br>(අ) '' වත්ත '' යන්නේ අර්ථකථනයෙහි '' අක්කර දහයක්'' යන වචන වෙනුවට ''හෙක්ටෙයාර් හතරක්'' යන වචන ; සහ<br><br>(ආ) '' කුඩා ඉඩම '' යන්නේ අර්ථකථනයෙහි '' අක්කර දහයකට '' යන වචන වෙනුවට '' හෙක්ටෙයාර් හතරකට '' යන වචන<br><br>ආදේශ කරන්න. |